බලශක්ති අමාත්‍යාංශය
வலுசக்தி அமைச்சு
MINISTRY OF ENERGY

437, ගාලු පාර, කොළඹ 03 | 437, காலி வீதி, கொழும்பு 03 | 437, Galle Road, Colombo 03

මගේ අංකය / எனதுஇல / My No – DEV/01/06/01/05 (ii)
ඔබේ අංකය / உமது இல / Your No –
දිනය / திகதி / Date – 2026.03. 17


**ලේකම්**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**ජාතික ඉන්ධන බලපත්‍ර ක්‍රමය (QR System) ක්‍රියාත්මක කිරීම.**

ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2026.03.06 දින එම කමිටුව විසින් ගනු ලැබූ තීරණ සම්බන්ධයෙන් ඔබට ද පිටපතක් සහිතව එවා ඇති අංක PS/FSP07/01(XII)/FPSC හා 2026.03.12 දිනැති ලිපිය සම්බන්ධයෙනි.

02. ඒ අනුව ගෝලීය හා භූ දේශපාලනික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මෙරට ඛනිජ තෙල් සැපයුම හා මිල පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික ඉන්ධන බලපත්‍ර ක්‍රමය (QR System) නැවත ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

03. ඒ අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන යෙදීමට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා එම තොරතුරු ඇතුළත් කළ යුතු කෘෂිකර්ම අයදුම්පත්‍ර 01, 02 සහ මාර්ගෝපදේශද මේ සමඟ එවමි. ඒ සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාළ ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. ඒ අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන යෙදීමට අදාළව මේ සමඟ එවා ඇති අයදුම් පත්‍රය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාළ ප්‍රාදේශීය නිලධාරීන්ගේ නිර්දේශය සහිතව ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියට යොමුකරන මෙන් කාරුණිකව ඉල්ලන අතර කෘෂිකර්ම අයදුම්පත්‍ර 02 අනුව අදාළ තොරතුරු පහත විද්‍යුත් ලිපිනයට යොමු කරන මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි.


**සී.ඒ.සුනෙත් ලෝචන මහතා**
අතිරේක ලේකම් (සංවර්ධන)
දුරකථන අංක: 071 8050660

**එස්.පී.ඒ.ජයරත්න මහතා, සංවර්ධන නිලධාරී**
දුරකථන අංක: 077 3869290 / 011 2372130
විද්‍යුත් තැපැල් ලිපිනය: **qrfuelpass@gmail.com**


**සී.ඒ.සුනෙත් ලෝචන**
**අතිරේක ලේකම් (සංවර්ධන)**

**අත්කළේ / මහාචාර්ය කේ.ටී.එම්. උදයංග හේමපාල**
**ලේකම්**
**බලශක්ති අමාත්‍යාංශය**

පිටපත්: 01. සියලුම දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.
02. අධ්‍යක්ෂ ජෙනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස. සහ අ.ක.ස.




Scanned with CamScanner

කෘෂිකර්ම ආකෘති පත්‍රය 01

**<u>කෘෂිකාර්මික කටයුතු සඳහා/ ජාතික ඉන්ධන බලපත්‍ර ක්‍රමය අනුව දිස්ත්‍රික් මට්ටමින් ඉන්ධන නිකුත් කිරීම.</u>**

1. අයදුම්කරුගේ නම :.........................................................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය:................................................... දිස්ත්‍රික්කය :.............................................
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:.................................. ග්‍රාම නිලධාරී කොට්ඨාශය :.................................
4. ජංගම දුරකථන අංකය:.......................................................................

| කෘෂි උපකරණ වර්ගය | අවශ්‍යතාවයේ ස්වභාවය : I අස්වනු නෙළීම/ II යල කන්නයේ වගා ආරම්භ කිරීම |
|---|---|
| වගා කර ඇති භූමි ප්‍රමාණය | |

| ඉන්ධන වර්ගය | සතිපතා අවශ්‍යතාවය (ලීටර්) | සාධාරණීකරණය |
|---|---|---|
| ලංකා ඔටෝ ඩීසල් | | |
| පෙට්‍රල් 92 | | |
| භූමිතෙල් | | |

අයදුම්කරුගේ අත්සන

................................................. දිනය : ..............................................

**නිර්දේශ කරමි**

.................................................
කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර
(අත්සන සහ නිල මුද්‍රාව)

.................................................
ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරී
(අත්සන සහ නිල මුද්‍රාව)

**අනුමත කරමි**

..................................................................
ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම්
(අත්සන සහ නිල මුද්‍රාව )

Scanned with CamScanner

සාරාංශ වාර්තාව

**ජාතික ඉන්ධන බලපත්‍ර ක්‍රමය අනුව දිස්ත්‍රික් මට්ටමින් ඉන්ධන නිකුත් කිරීම**

**(කෘෂිකාර්මික කටයුතු සඳහා)**

**දිස්ත්‍රික්කය :.....................................**

**ඉල්ලුම් කරන කාලය :** **දින සිට: ............................ දින දක්වා ..............................**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | භූමි ප්‍රමාණය | කාරණය | භූමි ප්‍රමාණය අනුව ඉන්ධන අවශ්‍ය ප්‍රමාණය (ලීටර්) | | |
|---|---|---|---|---|---|---|
| | | | | පෙට්‍රල් | ඩීසල් | භූමිතෙල් |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | එකතුව | | | | | |

අනුමත කරමි

දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
(අත්සන සහ නිල මුද්‍රාව)

Scanned with CamScanner

# ජාතික ඉන්ධන බලපත්‍ර ක්‍රමය (QR System) ක්‍රියාත්මක කිරීම

මාර්ගෝපදේශ:

කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉන්ධන යෙදීමට අදාළව පහත උපදෙස් අනුව අදාළ තොරතුරු ලබාදෙන මෙන් දැනුම් දෙමි.

01. රජය විසින් දැනුවත් කර ඇති ආකාරයට වගා කර ඇති භූමි ප්‍රමාණය හා අවශ්‍යතාවය පදනම් කර ගෙන ඉන්ධන අවශ්‍යතාවය ගණනය කළ යුතුය.

02. ඉන්ධන අවශ්‍ය කාරණය පැහැදිළිව සඳහන් කර අවශ්‍යතාවය අනුව ඉන්ධන ඉල්ලුම්පත්‍ර යොමු කළ යුතුය.

03. අයදුම්කරු/ ඉල්ලුම්කරු විසින් කෘෂිකර්ම ආකෘති 01 අයදුම්පත්‍රය පිටපත් 05කින් සම්පූර්ණ කිරීමෙන් පසු කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර, ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරිගේ නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

**සැලකිය යුතුයි.**

1 එක් පිටපතක් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර සතුව තබාගත යුතුය.

2. එක් පිටපතක් ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරි සතුව තබාගත යුතුය.

3. පිටපත් දෙකක් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර එම පිටපත් දෙක අදාළ ඉන්ධන පිරවුම්හල වෙත යොමු කළ යුතුය.

4. ඉදිරිපත් කරන ලද ඉන්ධන අවශ්‍යතාවය ආකෘතිපත්‍ර දෙක අනුව සාරාංශ කර දිසාපති/ දිස්ත්‍රික් ලේකම් වෙත දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

04. අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සාරාංශ කර කෘෂිකර්ම ආකෘති පත්‍රය 02 අනුව දිසාපති/ දිස්ත්‍රික් ලේකම් අනුමැතිය සහිතව බලශක්ති අමාත්‍යාංශයේ පහත විද්‍යුත් ලිපිනයට එවිය යුතුය.

විද්‍යුත් තැපැල් ලිපිනය: **qrfuelpass@gmail.com**

05. මීට අමතරව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර විසින් එක් එක් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරන ඉන්ධන ප්‍රමාණය පිළිබඳ ලේඛණයක් නඩත්තු කළ යුතුය.

**ලේකම්**
බලශක්ති අමාත්‍යාංශය

Scanned with CamScanner